SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

ශ්‍රේණිය Grade: 13	විෂයය Subject: **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I**	කාලය Time: පැය 02

නම : .....

I කොටස

❖ සියළුම ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(01) ප්‍රමාණවත් ලෙස කාලීන තොරතුරු අන්තර්ගත නොවන මාධ්‍ය ද්විත්වය කුමක් ද?
(1) ගුවන්විදුලිය හා රූපවාහිනිය (2) සිනමාව හා පුවත්පත
(3) රූපවාහිනිය හා සිනමාව (4) පුවත්පත හා සඟරාව
(5) සඟරාව හා පොත

(02) මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ සදොස් ප්‍රකාශය තෝරන්න.
(1) එය බහුමානීය සංකල්පයකි.
(2) සංජානනය කරන තොරතුරු මත පදනම් වේ.
(3) චිත්තිවේගී, සෞන්දර්යාත්මක සහ සදාචාරමය පැතිකඩ ද වැදගත් වේ.
(4) මාධ්‍යයට බහුල ලෙස නිරාවරණය වීම මත පදනම් වූවකි.
(5) ස්වෝත්සාහයෙන් වර්ධනය කර ගත හැකිය.

(03) ජන සන්නිවේදනයේ ප්‍රයෝජන අතර අයත් වන්නේ,
(1) සංවේදනය (2) සහජීවනය (3) සුපරික්ෂණය
(4) සහසම්බන්ධය (5) ප්‍රජානනය

(04) සන්දේශයක් අවබෝධ කර ගැනීම හා අර්ථකථනය අයත් වන්නේ,
(1) විචාරයට (2) විශ්ලේෂණයට ය (3) සාක්ෂරතාවයට ය
(4) ඇගයීමට ය (5) පරිහරණයට ය

(05) මාධ්‍ය සංදේශයක යටි පෙළ යනු සංදේශයේ,
(1) සැඟවුණු අර්ථයයි. (2) රූප හා පෙළයි (3) ඇසෙන හා දකිනු දෙයයි
(4) සංඥා හා සංකේතයි (5) අන්තර්ගතයයි

(06) උසස් මාධ්‍ය සාක්ෂරතාවයක් ඇති කර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන 3ක් පිළිබඳව 2011 වර්ෂයේ දී විග්‍රහ කළ විද්‍යාඥයා වන්නේ,
(1) ඒඩ්වඩ් සැපිර්ය. (2) තෝමස් ජෙපර්සන් ය (3) ඩබ්. ජේම්ස් පොටර්ය
(4) පිලිප් කොට්ලර් ය (5) ඩිෆ්ලුවර් ය.

(07) අභ්‍යන්තර මහජන සම්බන්ධතා මෙවලම් පමණක් ඇතුළත් වරණය තෝරන්න,
(1) ප්‍රවෘත්ති නිවේදනය, පුවත් හසුන, වාර්ෂික වාරිකා
(2) විද්‍යුත් තැපෑල, මාධ්‍ය කට්ටල, පුවත් හසුන
(3) දැන්වීම් පුවරුව, වාර්ෂික වාරිකා, අභ්‍යන්තර ඇමතුම් පද්ධතිය.
(4) යෝජනා පෙට්ටිය, ප්‍රදර්ශන, දැන්වීම් පුවරුව
(5) වාර්ෂික වාර්තා, අභ්‍යන්තර ඇමතුම් පද්ධතිය, ප්‍රවෘත්ති නිවේදනය

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(08) මාධ්‍ය නිලධාරියා, මහජන සම්බන්ධතා නිලධාරියා සහ සිද්ධි කළමනාකරු යන භූමිකා තුනටම පොදු නොවන කාර්යය කුමක් ද?
(1) ප්‍රතිරූප ප්‍රවර්ධන ය
(2) සම්මන්ත්‍රණ පැවැත්වීම
(3) මූල්‍ය කළමනාකරණය යි
(4) මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම
(5) අර්බුද කළමනාකරණය

(09) ජනශ්‍රැති හා ජනකලාවට ග්‍රාහක ආකර්ෂණය වැඩිවීමට හේතුව කුමක් ද?
(1) එහි ඇති සරල ව්‍යුහය නිසා
(2) තමාට සහ තම කණ්ඩායම් වල ජනවිඥානයන්ට සමීපය යන හැඟීම නිසා
(3) කලාන්තරයක් තිස්සේ තම සංස්කෘතිය විසින් පිළිගත් නිසා
(4) පරම්පරා උරුමයක් ලෙස පිළිගත යුතු නිසා.
(5) එමඟින් සමාජ හා ආගමික, ආර්ථික පසුබිම නියෝජනය නිසා

(10) සුනන්ද මහේන්ද්‍රයන් දක්වන ආකාරයට ජනකලා හා ජනශ්‍රැති යනු,
(1) ජනකතා, ජනකවි, ජන ක්‍රීඩා, ජන ඇදහැලි, ජන විශ්වාස, ජන ප්‍රවාද, පුරාණෝක්ති අධ්‍යයනය කිරීම ලෙසය.
(2) කලාව, සදාචාරය, ආගම, භාෂාව, ඇඳුම් පැලඳුම් නෙසයත
(3) කාලයක් තිස්සේ මුඛ පරම්පරාගත සම්ප්‍රදායේ ව්‍යාප්ති වූවක් ලෙසය.
(4) ආකල්ප, සිරිත් විරිත්, ඇවතුම් පැවතුම්, විශ්වාස, ඇදහිලි වල එකතුවක් ලෙසය.
(5) පුද්ගලයෙකු හෝ පුද්ගල සමූහයක්, සමාජයක් විසින් සිය සංස්කෘතියක උරුමයේ කොටසක් ලෙස පවත්වාගෙන යන නිර්මාණාත්මක කලාවකි

(11) මාධ්‍ය සංස්කෘතිය සමකාලීන සමාජයෙහ් ඉටුකරන කාර්යයන් අතරට අයත් නොවන්නේ,
(1) විඥාපන කාර්යය
(2) සන්නිවේදනාත්මක කාර්යය
(3) දෘෂ්ටිවාදී කාර්යය
(4) නිර්මාණාත්මක කාර්යය
(5) ප්‍රතිශෝධන කාර්යය

(12) ඥාන ව්‍යුහයක් ගොඩනගා ගැනීමට අතිශයින් ඉවහල් වන මූලික ද්‍රව්‍ය වන්නේ,
(1) තොරතුරු ය.
(2) පර්යාලෝකය යි
(3) දැනුමය
(4) ස්වකේන්ද්‍රයයි
(5) කුසලතාවය යි

(13) සිනමාව කර්මාන්තයක් ලෙස සැලකීමේදී වර්ගීකරණය කළ හැකි ප්‍රභේද දෙක වන්නේ,
(1) වාණිජ හා කලාත්මක
(2) වාණිජ හා ජනප්‍රිය
(3) සම්භාව්‍ය හා ජනප්‍රිය
(4) පවුලේ චිත්‍රපට හා වැඩිහිටි චිත්‍රපට
(5) වාණිජ හා සම්භාව්‍ය

(14) වර්තමානයේදී තාක්ෂණික දියුණුව සමඟ චිත්‍රපට ප්‍රවර්ග කළ හැකිය. ඒ කෙසේ ද?
(1) ක්‍රියාකාරි, වාර්තා, හාස්‍යෝත්පාදක චිත්‍රපට
(2) ප්‍රේම, විද්‍යා ප්‍රබන්ධ, ත්‍රාසජනක චිත්‍රපට
(3) යුද්ධ, සංගීත, සංත්‍රාස චිත්‍රපට
(4) චරිතාපදාන, වික්‍රමාන්විත, ග්‍රැෆික් චිත්‍රපට
(5) ඉහත සියල්ල නිවැරදිය

(15) පහත අංග අතරින් සාම්ප්‍රදායික මාධ්‍යයේ සුවිශේෂතාවක් වන්නේ,
(1) ගැමි සංකේත භාවිතය
(2) ගැමි ලැදියාව
(3) අනන්‍ය සංස්කෘතිකත්වය
(4) සරල ව්‍යුහ භාවිත කිරීම
(5) සාම්ප්‍රදායික සංස්කෘති නිරූපණය

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(16) ඉංග්‍රීසි භාෂාවෙන් Folklore යන්නෙහි අර්ථය ලෙස හඳුනාගත හැකි වන්නේ, මින් කුමන විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධව ද?
(1) සමාජ විද්‍යාව (2) මනෝ විද්‍යාව (3) මානව විද්‍යාව
(4) අධ්‍යාපන මනෝ විද්‍යාව (5) ජනශ්‍රැති විද්‍යාව

(17) සමාජ මාධ්‍යයේ අයහපත් බලපෑමක් නොවන්නේ,
(1) ව්‍යාජ ගිණුම් සැකසීම (2) ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙළඹවීම
(3) වැරදි තොරතුරු පල කිරීම (4) ගෘහස්ථ දුරස්ථභාවය පැවතීම
(5) මානසික අවපීඩනය, කනස්සල්ල, හුදෙකලාව ඇතිවීම.

(18) නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය කාර්යභාරයක් නොවන්නේ,
(1) සමාජානුයෝජනය (2) අධ්‍යාපනය (3) විනෝදාස්වාදය
(4) තොරතුරු සම්පාදනය (5) ජනමත ඇති කිරීම

(19) පහත අංග අතුරින් සාම්ප්‍රදායික මාධ්‍යයේ සුවිශේෂතාවක් නොවන්නේ,
(1) අවම පිරිවැය (2) සංස්කෘතික සන්දර්භය (3) නම්‍යශීලිත්වය
(4) තේමාත්මක අන්තර්ගතය (5) අනුගත වීමේ කාර්යය

(20) සිද්ධි කළමනාකරණයේ අවස්ථා වන්නේ,
(1) සැලසුම, ඇගයීම, විශ්ලේෂණය, ක්‍රියාව
(2) සැලසුම, පිලියෙල කිරීම, විමසුම, ක්‍රියාව
(3) ක්‍රියාව, සංස්ලේෂණය, විශ්ලේෂණය, ඇගයීම
(4) පසුවිපරම, ඇගයීම, නිර්මාණ, සැලසුම
(5) හඳුනා ගැනීම, ස්ථාන පරික්ෂාව, සහභාගීත්ව නිරීක්ෂණ, සැලසුම

(21) පහත ඒවායින් සමකාලීන මාධ්‍ය සංස්කෘතිය තුළ අභිසාරී මාධ්‍ය ප්‍රවණතාව වර්ධනය වන්නේ,
(1) ජන මාධ්‍ය නාලිකාවල ප්‍රමාණාත්මක වර්ධනය නිසා ය.
(2) ජංගම දුරකථන මගින් ග්‍රාහක අන්තර් ක්‍රියාකාරිත්වය වර්ධනය වීම නිසා ය.
(3) අන්තර්ජාලයේ ව්‍යාප්තිය නිසා ය.
(4) සන්නිවේදනයේ දෘශ්‍ය ප්‍රවණතාව වර්ධනය වීම නිසා ය.
(5) ගෝලීයකරණයේ දැඩි බලපෑම නිසා ය.

(22) ජන සංස්කෘතියේ සම්පිණ්ඩිත සාරය ලෙස සැලකෙන්නේ,
(1) සාම්ප්‍රදායික සංස්කෘතිය යි (2) ජනප්‍රිය සංස්කෘතිය යි
(3) සම්භාව්‍ය සංස්කෘතිය යි (4) මාධ්‍ය සංස්කෘතිය යි
(5) ජන සංස්කෘතිය යි

(23) 20 වන සියවස මැද දී සංස්කෘතික අධ්‍යයනයේ ප්‍රමාණවත් වශයෙන් බිහි වූ සංස්කෘති ක්‍රමවේද විෂයේ ළදරුවෙකු ලෙස බිහිවූයේ,
(1) සම්භාව්‍ය සංස්කෘතිය (2) ජන සංස්කෘතිය
(3) ජනප්‍රිය සංස්කෘතිය (4) මාධ්‍ය සංස්කෘතිය
(5) ගෝලීය සංස්කෘතිය

(24) ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ විග්‍රහයේ දී අවධානයට හසු නොවන්නේ,
(1) සංස්කෘතික නිෂ්පාදන ක්ෂේත්‍රයයි (2) ප්‍රමාණාත්මක ක්ෂේත්‍රය යි
(3) හෙජමෝනිය සංකල්ප ක්ෂේත්‍රයයි (4) බහුජන සංස්කෘතිය ක්ෂේත්‍රයයි
(5) සෞන්දර්ය විද්‍යාත්මක ක්ෂේත්‍රයයි

(25) Event යන්න සිදුවීම, සිද්ධිය, ඉසව්ව, අවස්ථාව, උත්සවය ලෙස සඳහන් වන්නේ,
(1) කේම්බ්‍රිජ් ශබ්ද කෝෂය (2) සුමංගල ශබ්ද කෝෂය (3) හරිස්චන්ද්‍ර විජේතුංග ශබ්දකෝෂය
(4) මලලසේකර ශබ්ද විසිනි. (5) ප්ලිප් කොට්ලර් විසිනි.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(26) මහජන සම්බන්ධතා කාර්යයේ දී සිද්ධි කළමනාකරණ කාර්යය අවශ්‍ය වන්නේ,
(1) මහජන සමූහයක් එක තැනකට රැස්වීම නිසාවෙනි
(2) යම් සුළු හෝ අතපසු වීමකදී මහජන සමූහය අපහසුතාවයට පත්වීම හේතුවෙනි.
(3) යම් දුර්වලතාවයකදී එය මාධ්‍ය නිලධාරියාගේ දුර්වලතාවයක් වේ යැයි හැඟෙන නිසා.
(4) ආයතනයේ හෝ සංවිධානයේ කීර්තිනාමයට එය කැලලක් විය හැකි නිසාවෙනි.
(5) සුළු හෝ අතපසු වීමක් සමස්ථ සැලැස්ම බිඳ වැටීමට හේතු විය හැකි නිසාවෙනි.

(27) A - සාමූහික ප්‍රපංචයකි B - නිර්මාණ අකර්තෘකාරකය
C - පොදු වටිනාකම් ඇත D - ඍජුව ම සමාජ ක්‍රියාවලිය සමඟ සම්බන්ධ වේ.
E දෛනික ශ්‍රම ක්‍රියාකාරිත්වය සමඟ ඍජු සම්බන්ධතාවක් ඇත. ඉහත කරුණුවලින් ජන සංස්කෘතියට අදාළ වන්නේ,
(1) A හා B පමණි (2) A, B, C පමණි (3) C, D, E පමණි
(4) A, C, D පමණි (5) A, B, C, D, E යනු සියල්ලම ය.

(28) ඥාන ව්‍යූහයක් ගොඩනගා ගැනීමට අතිශයින් ඉවහල් වන මූලික ද්‍රව්‍ය වන්නේ,
(1) තොරතුරු (2) දැනුම (3) පර්යාලෝකය යි
(4) ස්වකේන්ද්‍රය යි (5) කුසලතායි

(29) ජනතාව හා ඔවුන්ගේ ගැටළු යන කෘතිය රචනා කරමින් සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයට දායකත්වයක් සපයන ලද්දේ කවුරුන් විසින් ද?
(1) චාල්ස් කූලී (2) එච්වඩ් සැපීර් (3) ජොන් ඩුවී
(4) ජෝර්ජ් ගාබ්නර් (5) වෝල්ටර් ලිප්මාන්

(30) තොරතුරු ගබඩා කර සංරක්ෂණය කර ගැනීම සඳහා මූලික පදනම සකස්වන්නේ,
(1) කථන සන්නිවේදනය ආරම්භයක් සමඟ ය.
(2) ලිඛිත සන්නිවේදනය ආරම්භයත් සමඟ ය
(3) ජන මාධ්‍යවල ආරම්භයත් සමඟ ය.
(4) ඩිජිටල් දත්ත සංචිතකරණයේ ආගමනයත් සමඟය.
(5) මුද්‍රණ තාක්ෂණයේ දියුණුවත් සමඟය.

(31) පහත අය අතරින් මහජන සම්බන්ධතා පිළිබඳ පුරෝගාමී අයෙකු වන්නේ,
(1) සෑම්බ්ලැක් (2) චාල්ස් කූලී (3) එල් බර්නීස්
(4) චාල්ස් ප්ලැකාර්ඩ් (5) චාල්ස් ඔස්ගුඩ්

(32) ස්ත්‍රීවාදී විචාරයෙන් අදහස් වන්නේ,
(1) ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳ, ලිංගිකත්වය හා සමානාත්මතා පදනමේ සිට විචාරය කිරීමයි.
(2) ස්ත්‍රී අයිතිවාසිකම් වෙනුවෙන් මාධ්‍ය පෙනී සිටිය යුතු බවයි.
(3) ලිංගිකත්වය ඉස්මතු කරමින් කාන්තාවන්ගේ අනන්‍යතාව බිඳ වට්ටවා ඇති බවයි.
(4) කාන්තාවන් වර්තමානයේ වෙළඳ භාණ්ඩයක් වී ඇති බවයි.
(5) ස්ත්‍රීන් වැඩි වැඩියෙන් මාධ්‍ය ක්ෂේත්‍රයට යොමු කර ගත යුතු බවයි.

(33) ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය අන්තර්ගතයෙහි නව ප්‍රවාණතාවක් නොවන්නේ,
(1) සරල භාෂා භාවිතය
(2) වෙළඳ දැන්වීම් ප්‍රමාණාත්මකව ඉහළ යාමයි.
(3) ඉදිරිපත් කිරීමේ නව මාදලි යොදා ගැනීමයි
(4) විනෝදාස්වාදය කෙරෙහි වැඩි අවධානයක් දැක්වීම යි.
(5) පුවත් විවරය ක්‍රමයෙන් විශාල වීමයි.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(34) ජන මාධ්‍ය, ඡායාරූපකරණය, සිනමාව, නව මාධ්‍ය බිහිවීම ප්‍රබල විපර්යාසයක් ඇති කරනු ලැබුවේ කුමන ක්ෂේත්‍ර වලද?
(1) සංස්කෘතිය ව්‍යාප්තකරණයේ ය.
(2) සංස්කෘතික යාන්ත්‍රණයේ මාදිලිවලය.
(3) සංස්කෘතිය බිහිවීමේ හා පැවැත්මේය.
(4) සංස්කෘතිය ක්‍රියා කිරිමේදී ය
(5) ඉහත සියල්ලගේම එකතුවකි.

(35) කෝලම්, සොකරි, ආදි කලා අංග අයත් වන්නේ,
(1) ගැමි නාටක
(2) ජන කතා
(3) නූර්ති
(4) ජන කවි
(5) උපමා කතා

(36) HUB ආකෘතියේ කේත (codes) යන්නෙන් දැක්වෙන්නේ,
(1) සන්නිවේදනය සඳහා යොදා ගන්නා බහුවිධ සංඥා පද්ධතිය යි.
(2) මාධ්‍ය සංදේශ වාරණයට ලක් කරන ක්‍රියාවලිය යි.
(3) ජන සන්නිවේදන සංදේශයන් ග්‍රහණය කර ගන්නා පිරිසයි.
(4) මාධ්‍ය විකෘතියක් ඇති කරන විවිධාකාර ඝෝෂා තත්ත්වයි
(5) ග්‍රහකයන් සතු අත්දැකීම් පසුතලයයි

(37) විඥානික, අවිඥානික වශයෙන් ක්‍රියාත්මක වන්නේ,
(1) පර්යාලෝකය යි
(2) මනෝ විශ්ලේශණවාදයයි
(3) ඥාන ව්‍යූහයයි
(4) මිනිස් සිතයි
(5) ස්වකේන්ද්‍රය යි

(38) මනෝ විශ්ලේෂණවාදී විචාරය යනු,
(1) මාධ්‍ය සංදේශ වලට ඇතුලත් කරුණු පුද්ගල මනසට බලපෑම් කරන ආකාරය පිළිබඳ විමසා බැලීමයි.
(2) ඕනෑම මාධ්‍ය සංදේශයක් කුමන හෝ ආකාරයේ බලපෑමක් ග්‍රාහකයාට ඇති කරන බවයි.
(3) මාධ්‍ය සංදේශ මනෝ විද්‍යාත්මක විචාරයකින් බැලිය හැකි ලෙස සකස් කළ යුතු බවයි.
(4) මනෝ විද්‍යාව ඔස්සේ මාධ්‍ය සංදේශ අවධානයට ගැනීමයි.
(5) මාධ්‍ය ආකෘති නිර්මාණය වන්නේ සිත්වන් සිග්මන් ප්‍රොයිඩ්ගේ ආකෘතිවලට අනුවයි.

(39) මාධ්‍යයට ප්‍රවේශ වීම, මාධ්‍යය විශ්ලේෂණය, මාධ්‍යයන් ඇගයීම මාධ්‍ය නිර්මාණය, මාධ්‍ය තුළ ක්‍රියාශීලීව කටයුතු කිරීම මාධ්‍ය සාක්ෂරතාවය බව ප්‍රකාශ කර ඇත්තේ,
(1) යුනිස්කෝ සංවිධාන ය
(2) සාක් සංවිධානය
(3) ජාතික ආයතනය ඇමරිකාව
(4) යුරෝපා කොමිසම
(5) සුනිසෙෆ් සංවිධානය

(40) මාධ්‍ය සාක්ෂරතාවේදී සෞන්දර්ය මානය ලෙස හඳුන්වන්නේ,
(1) කලාත්මක පැතිකඩක් ඔස්සේ මාධ්‍ය නිර්මාණ විමර්ශනය කිරීමයි.
(2) මාධ්‍ය නිර්මාණය කුමක් වුවත් එහි කලාත්මක ප්‍රවේශයක් තිබිය යුතු බවයි.
(3) සෞන්දර්යාත්මක නොවුනහොත් මාධ්‍ය නිර්මාණය ග්‍රාහක ගත නොවීමයි.
(4) ඇගයීම් උත්සව වලදී නිර්මාණය කොතෙකුත් දුරට සෞන්දර්යාත්මකද යන්න බැලීමයි.
(5) මාධ්‍ය නිර්මාණයක පසුතල සැකසීම, එයට කෙතරම් සාධාරණයක් ඉටු කර ඇති ද යන්න බැලීම.

(41) සන්දේශයක ''උපපෙළ'' යන්නට අයත් වන්නේ,
(1) පුවතේ ශිර්ෂ පාඨයන් ය
(2) අවධානය යොමු කිරීමට යොදාගන්නා ඡායාරූප, අකුරු වචන ආදීන් ය.
(3) සංදේශයේ ගැබ්වුන ඉස්මතු නොකරන තොරතුරු ය.
(4) සංදේශයේ නොපෙනෙන හැඟීම් භාව ප්‍රකාශනයන් ය.
(5) සංදේශයක නොපෙනෙන, සැඟවුණු අර්ථයන් ය.

(42) මාක්ස්වාදී විචාරය මඟින් හැඳින්වෙන්නේ,
(1) ධනේෂ්වර සමාජ මාධ්‍ය හිමිකමට දායක වන බවයි.
(2) ධනපති අවශ්‍යතා වෙනුවෙන් මාධ්‍ය නැඟී සින බවයි.
(3) විරෝධාකල්ප ඉදිරිපත් කරමින් ධනපති විරෝධී අදහස් මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම යි.
(4) ධනේෂ්වර සමාජයේ අවශ්‍යතා හා වරප්‍රසාද ශක්තිමත් කිරීමට මාධ්‍ය කටයුතු කිරීමයි.
(5) කාල්මාක්ස් තම දර්ශනයේදී මාධ්‍ය කිසිසේත් පිළි නොගන්නා බවයි

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(43) භාෂා භාවිතයේ නිර්මාණාත්මක බව පදනම් වන කරුණු තුන වන්නේ,
(1) කථනය, ශ්‍රවනය, ලේඛනය
(2) කථා කිරීම, ලිවීම, රූපණය
(3) සවන්දීම, ගායනය, ලිවීම.
(4) ශ්‍රවණය, විවරණය, භාෂණය
(5) රූපණය, විවරණය, භාෂණය

(44) නිර්මාණ ශිල්පියා යනු ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයට අනුව,
(1) යම් දෙයක් සෑදූ හෝ නිපද වූ පුද්ගලයා ය
(2) නිර්මාණශීලී නිමැවුම්කරුය
(3) නිර්මාණශීලි මනසින් නිර්මාණය කරනු ලබන්නා ය.
(4) නිර්මාණශීලී අදහස් සහිත පුද්ගලයා ය.
(5) නිර්මාණාත්මක චින්තනය යොදා ගන්නා පුද්ගලයා ය.

(45) ලියෝ ට්‍රෝල්ස්ට්‍රෝයි දක්වන ආකාරයට කලාව යනු,
(1) මාධ්‍ය සංදේශ නිර්මාණාත්මක මිනිසුන්ගේ අපිරිමිත උත්සාහයක ප්‍රතිඵලයකි.
(2) ඓතිහාසික මානව විකාශනයේ වර්තමාන ප්‍රතිඵලයකි.
(3) කෙනෙකු යම් හැඟීමක් විඳ ගැනීමෙන් පසු සංකේත ඇසුරින් එය අන්‍යයන්ට දැක්වීමයි.
(4) චලනය ප්‍රතිනිර්මාණය කිරීමයි.
(5) තොරතුරු මාධ්‍ය ලෙස මුලින්ම බිහිවුනු ජනමාධ්‍ය පසුව කාල මාධ්‍ය බවට පත්වීමයි.

(46) මහජන සම්බන්ධතා කාර්යයේදී PRO ලෙස හඳුන්වන්නේ,
(1) ආයතනයක ප්‍රවෘත්ති නිලධාරියා
(2) ආයතනයක මහජන සම්බන්ධතා නිලධාරියා
(3) ආයතනයක මාධ්‍ය නිලධාරියා
(5) ඉහත සියලුම කාර්යයන් දරණ පුද්ගලයින් ය
(5) ඉහත කිසිදු පුද්ගලයෙකු නොවේ

(47) ද්විමාගික සමමිතික ආකෘතියට අයත් නොවන්නේ,
(1) 1980 වන විට මහජන සම්බන්ධතා යන විෂයය සංවර්ධනය වීම.
(2) බලපෑම යන්න අහිතකර ලෙස වර්ධනය වීම නිසා ආචාරධර්මවල වැදගත්කම මතුවීම.
(3) මහජන සම්බන්ධතා විෂය ඵලදායි ලෙස අධ්‍යාපන ප්‍රතිපත්තිවලට එක් කිරීම.
(4) එතෙක් පැවති ප්‍රයෝගකාරී ප්‍රචාරණ සංවිධාන වෙනස් විය යුතු බව වැටහීම.
(5) එවැනි සංවිධාන හා ග්‍රාහකයා අතර අවබෝධය වර්ධනය කිරීමේ අවශ්‍යතා මතුවීම.

(48) දැන්වීම්කරණය හා මහජන සම්බන්ධතා අතර ඇති වෙනස වන්නේ,
(1) දැන්වීම්කරණය අලෙවිකරණ කාර්යභාරයකි.
(2) මහජන සම්බන්ධතා කළමණාකරණ කාර්යයක් වුවද අලෙවිකරණ කාර්යයක් නොවේ.
(3) අනුග්‍රාහකත්වය මගින් මහජන සම්බන්ධතා ඇති කළ හැකිය.
(4) දැන්වීම්කරණය මගින් ඇති කරන පෙළඹවීමද මහජන සම්බන්ධතා ඇති කරයි.
(5) උක්ත කරුණු සියල්ලම නිවැරදියි

(49) රාජ්‍ය මහජන සම්බන්ධතා යන්න නිවැරදිව කියවෙන්නේ,
(1) රාජ්‍යයක විදේශ ප්‍රතිපත්තිය
(2) තානාපති කාර්යාල සමග සම්බන්ධතා පැවත්වීම
(3) විවිධ අන්තර්ජාතික සංවිධාන පිහිටුවා ගැනීම.
(4) බලපත්‍ර ලබාගැනීම.
(5) අන්තර් ජාතිකව රාජ්‍ය දෙකක් හෝ කිහිපයක් සමඟ පවත්නා යහපත් සම්බන්ධයකි

(50) මානව සමාජයේ පරිණාමයත් සංවර්ධනයත් සමඟ ක්‍රමයෙන් බිහිවුණු මහජන ඒකකයක් නොවන්නේ,
(1) අධ්‍යාපනය
(2) ආගම
(3) සංස්කෘතිය
(4) දේශාපාලනය
(5) සෞන්දර්යාත්මක

SLGURU.LK
For Educational Purpose Only

“The mind is not a vessel to be filled, but a fire to be kindled.” — Plutarch

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

ශ්‍රේණිය Grade	13	විෂයය Subject	සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය II	කාලය Time	පැය 03

නම : .....

❖ පහත ප්‍රශ්න අතුරින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) මහජන සම්බන්ධතාවය යනු පුද්ගල පවුලේ සිට සමස්ත සමාජයටම අත්‍යාවශ්‍ය වූ සංකල්පයකි.

(i) මහජන සම්බන්ධතාව යනු කුමක්දැයි පිළිගත් නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න

(ii) මහජන සම්බන්ධතාවට අදාළ ප්‍රධාන ආකෘති හතරකි. එම ආකෘති හතර නම් කර ඉන් දෙකක් පැහැදිලි කරන්න.

(iii) මහජන සම්බන්ධතාව තුල භාවිතා කරන මෙවලම් සහ විධි ප්‍රධාන වශයෙන් ඒක මාර්ගික හා ද්විමාර්ගික වශයෙන් කොටස් දෙකකි. ඒකමාර්ගික හා ද්විමාර්ගික මෙවලම් දෙක බැගින් දක්වා එම මහජන සම්බන්ධතාවට යොදාගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(iv) සිද්ධි කළමනාකරණය යනු කුමක් ද?
සිද්ධි කළමනාකරනය යොදා ගන්නා අවස්ථා 4ක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න

(02) සමකාලීන මාධ්‍ය ප්‍රවණතා වලට බෙහෙවින් ඉවහල් වූයේ අන්තර්ජාලයේ බලපෑමයි.

(i) නිර්මහා පරිමාණය යනු කුමක් ද?
එහි වාසි හතරක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) නිර්නියාමනය යනු කුමක් ද? එහි වාසි හතරක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ගෝලීකරණය යනු කුමක්දැයි හඳුන්වා ගෝලියකරණය හේතුවෙන් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සිදුවී ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.

(iv) මාධ්‍ය ප්‍රවණතාවයන් සමගම ග්‍රාහකයාගේ භූමිකාව වෙනස්වී ඇත. ග්‍රාහකයා තුල ඇතිවී ඇති වෙනස්කම් ධනාත්මක හා ඍණාත්මකව පැහැදිලි කරන්න.

(03) (i) සාම්ප්‍රදායික මාධ්‍ය යනු කුමක් ද?
ඔබ දන්නා සාම්ප්‍රදායික මාධ්‍ය හතරක් නම් කරන්න.

(ii) සාම්ප්‍රදායික මාධ්‍ය වෙනුවට අන්තර්ජලාය හා සබැඳි නව මාධ්‍යයේ ආගමනයත් සමග ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය මූළුමනින්ම වෙනස් වී තිබේ. නව මාධ්‍ය ලක්ෂණ 4ක් හඳුන්වා ඒවායේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.

(iii) ජනමාධ්‍යයේ කාර්යයභාරය පිළිබඳ යුනෙස්කෝ Many voices one world කෘතියේ සඳහන් වන්නේ කෙසේ ද? එම ලක්ෂණ පැහැදිලි කරන්න.

(iv) ගුවන්විදුලි මාධ්‍යයේ සුවිශේෂතා වලට අදාල ලක්ෂණ හතරක් පැහැදිලි කරන්න.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(04) නූතන සමාජය තුළ මාධ්‍ය නාලිකා කෙතරම් තිබුණද මානවයාගේ ආකර්ෂණය දිනාගත හැක්කේ නිර්මාණ සාර්ථකව ඉදිරිපත් කලහොත් පමණි.

(i) නිර්මාණාත්මක සන්නිවේදනය යනු කුමක් ද?
එහි මූලිකාංග 4ක් නම් කරන්න.

(ii) ලියනාඩෝ ඩාවින්චි විසින් නිර්මාණශීලිත්වයේ මූලිකාංග පිළිබඳ කරුණු හතක් දක්වයි.
ඒවා නම් කර ඉන් දෙකක් පැහැදිලි කරන්න.

(iii) රංගකලාවේ මූලිකාංග මොනවා ද?
එම මූලිකාංග නම් කර ඒවා අයත් අංග 2 බැගින් පැහැදිලි කරන්න.

(iv) ජනශ්‍රැති යනු මොනවා ද?
ජනශ්‍රැති අංග හතරක් හඳුන්වා ඒවා තුල දැකිය හැකි විශේෂතා පැහැදිලි කරන්න.

(05) සන්නිවේදන ක්‍රියාවලිය පවත්වාගෙන යාමට සන්නිවේදන වර්ග හා ස්වරූප වල ක්‍රියාකාරිත්වය ඉතා වැදගත් වේ.

(i) අන්තර්පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කරන්න.

(ii) මහජන සන්නිවේදනය සාර්ථක කර ගැනීමට යාදාගත හැකි උපක්‍රම හතරක් නම් කර ඉන් දෙකක් පැහැදිලි කරන්න.

(iii) අතථ්‍ය සන්නිවේදනයේ සුවිශේෂතා තුනක් නම් කර ඉන් දෙකක් පැහැදිලි කරන්න.

(iv) සමාජ මාධ්‍යයේ යහපත් බලපෑම් හා අයහපත් බලපෑම් දෙක බැගින් විස්තර කරන්න.

(06) (i) මාධ්‍ය සාක්ෂරතාව යනු කුමක්දැයි පිළිගත් නිර්වචනයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ii) උසස් මාධ්‍ය සාක්ෂරතාවයක් ඇති කරගැනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන තුන නම් කර ඉන් දෙකක් පැහැදිලි කරන්න.

(iii) මාධ්‍ය සාක්ෂරතාවයේ තෙවැදෑරුම් සිද්ධාන්ත සවිස්තරව පැහැදිලි කරන්න

(iv) පුවත්පත් තුල මාධ්‍ය ප්‍රචණ්ඩත්වය නිරූපනය වන අවස්ථා හතරක් පැහැදිලි කරන්න.

(07) (i) සංස්කෘතිය පිළිබඳ ඊ.බී. ටයිලර්ගේ නිර්වචනය ලියන්න

(ii) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමේ මූලික වැදගත්කම් හතරක් නම් කර, ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලංකාවට සන්නිවේදන විෂය හඳුන්වාදීමේ වැදගත් සන්ධිස්ථාන 03ක් නම් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) පුද්ගල දේහ භාෂාව භාවිතා කරමින් සිදුකරන නිර්වාචික සන්නිවේදන ක්‍රම 4ක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

SLGURU.LK
For Educational Purpose Only

“The mind is not a vessel to be filled, but a fire to be kindled.” — Plutarch

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.